www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව පවුල් 66,000ක් කොලඹින් පලවා හැරීමට සැරසෙයි

## Sri Lankan government to evict 66,000 families in Colombo

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**

**2010 අගෝස්තු 20**

ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ඇමති මන්ඩලය මහා ව්‍යාපාරිකයන් සඳහා ඉඩම් ලබා දීමට කොලඹ නගරය සහ ඒ අවට පවුල් 66,000ක් එලවා දැමීමේ ආරක්ෂක අමාත්‍යාංශ සැලැස්මක් පසුගිය සතියේ අනුමත කලේ ය. ඒ අනුව ලක්ෂ 5 ක් පමන ජනයාට නිවාස අහිමිවනු ඇත. අවිනිශ්චිත තැන්වල පදිංචියට යෑමට බලකෙරෙන නිසා තුල බොහෝදෙනෙකුට රැකියා ද අහිමි වනු ඇත.

අගෝස්තු 12 දා මෙම තීන්දුව ප්‍රකාශයට පත්කල වැඩ බලන මාධ්‍ය අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා ප්‍රකාශ කලේ මෙම පවුල් කොලඹ නගරය තුල "ඉතා වටිනා ඉඩම් අවුල් සහගත ලෙස අල්ලා ගෙන සිටින" බවය. පලමුවෙන්ම ආන්ඩුව සැලසුම් කරන්නේ පර්චස් එකක් රුපියල් මිලියන 2 ගනනෙන් බද්දට දී වානිජ සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් උපයා ගැනීමට ය.

යාපා කියන්නේ මෙම මුදලින් කොටසක් ඉවත් කරනු ලබන පවුල්වලට නිවාස තනාගැනීම සඳහා යොදාගනු ඇති බවය. අතීතයේ දී යලියලිත් පෙන්නුම් කර ඇති ආකාරයට මෙබඳු පොරොන්දු වල මොනම වටිනාකමක්වත් ඇත්තේ නැත. උදාහරනයක් හැටියට විපක්ෂ මන්ත්‍රී සජිත් ප්‍රේමදාස කියන්නේ 2004 සුනාමියේ දී ගෙවල් අහිමිවූ පවුල් 11,000ක් තවමත් තාවකාලික නවාතැන්වල සිටින බවය. සමස්තයක් වශයෙන් ගතහොත් රටේ දසලක්ෂයක් නිවාස නැති පවුල් සිටිති.

යෝජිත වැඩ පිලිවෙල කිසිසේත් ම "දුප්පතුන් ගොඩලීම සඳහා" නොවේ. එහි අරමුන වන්නේ අගනුවර මධ්‍යයේ තිබෙන ඉඩම් කොලඹ නගරය දකුනු ආසියාවේ වානිජ නගරය බවට පත් කර ගැනීමේ ආන්ඩුවේ මහා සැලැස්ම සඳහා යොදාගැනීම ය. මෙම සැලැස්ම 1999 මුලින්ම ප්‍රකාශයට පත් කරන ලදී. එහෙත් මහජන විරෝධය නිසා එය අත් හිටුවීමට සිදුවිය.

ආන්ඩුව මෙම සැලැස්ම සඳහා හමුදාව යොදාගෙන තිබෙන්නේ එය බරපතල මහජන විරෝධයකට ලක්වන බව දන්නා නිසා ම ය. මැයි මාසයේ දී නාගරික සංවර්ධන අධිකාරිය ද ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මන්ඩලය යන සිවිල් කටයුතු භාර අංශ දෙකම ආරක්ෂක අමාත්‍යාංශයට පවරා ගැනීමේ අත්‍යසමාන පියවර ගත්තේ ය. ආරක්ෂක අමාත්‍යාංශය පවතින්නේ රාජපක්ෂගේ සහෝදර ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යටතේ ය.

ආරක්ෂක අමාත්‍යාංශය වහාම තම බලතල ක්‍රියාවට දැමීය. වඩා පුලුල් සැලසුම් සඳහා අත්හදා බැලීමක් ලෙස ගන්නා ලද පියවරකදී මැයි මාසයේ 2,000ක් සන්නද්ධ හමුදාව සහ පොලීසිය, මැද කොලඹ කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ පවුල් 45ක් ඉවත් කිරීම සඳහා යොදවන ලදී. නිවාස ඩෝසර් කර සමතලා කර දමද්දී පොලීසිය සහ හමුදා භටයෝ විරුද්ධත්වය දක්වන්නවුන්ට බැටන් ප්‍රහාර එල්ල කොට ඔවුහු එම ප්‍රදේශයෙන් එලවා දැමූහ. ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශය පොලිසිය ද පාලනය කරයි.

2008 ජූලි මාසයේ දී කොම්පඤ්ඤවීදියේ ග්ලෙනී පැසේජ් නැමැති ප්‍රදේශයෙන් පවුල් 400ක් ඉවත්කර දැමීමට පොලීසියේ කැරලි මර්දන ඒකකය යොදාගන්නා ලදී. එම පවුල්වලින් සමහරකට දෙමටගොඩ ප්‍රදේශයෙන් නිවාස සපයා ඇති නමුත් පවුල් 80 ට වැඩි සංඛ්‍යාවක් ජීවත් වන්නේ උතුරු කොලඹ අවශ්‍ය මූලික පහසුකම් වත් නොමැති ලැලි ගැසූ කුඩා පැල්පත් වලය. නාගරික සංවර්ධන අධිකාරයේ සභාපති ජනක කුරුකුලසූරිය කියා ඇත්තේ කොලඹ නගර සීමාව තුල ජීවත්වන්ට උවමනා ඕනෑම පවුලක් කුලී ගෙවීමට සූදානම් විය යුතු බවය.

පසුගිය මාසයේ තවත් බලය පෙන්වීමක දී මට්ටක්කුලිය ප්‍රදේශයේ තරුනයෙකු අත්අඩංගුවට ගෙන පහර දීම පිලිබඳ විරෝධතාවයකට එරෙහිව දහස් ගනන් පොලීසිය සහ සොල්දාදුවෝ, මෙහෙයවන ලදහ. නිවාස ගනනාවක්ම කුඩුපට්ටම් කොට නිවැසියන්ට පහර දෙන ලදී. පසුදින සන්නද්ධ හමුදා උතුරු කොලඹ මට්ටක්කුලිය ප්‍රදේශයේ සියලුම වැඩිහිටි නිවැසියන් - 8,000ක් පමන - විවෘත පිට්ටනියකට ගාල් කලේය. ගෝනිබිල්ලන් යොදාගනිමින් මෙම සෙනග අතුරෙන්

සිද්ධියට සම්බන්ධ වූවන් යයි කොටසක් තෝරා වෙන් කර සිරභාරයට ගත්හ.

මේ වන විටත් මෙම නිවැසියන් බොහෝ දෙනෙකුට ඔවුන් දොට්ට දැමීමේ ඉලක්කය බවට පත්ව ඇති යයි පෙන්නුම් කල නාගරික සංවර්ධන අධිකාරියේ ටෝකන් කාඩ් නිකුත්කර තිබුනි.

කොලඹ උතුරේ ඇපල්වත්ත සහ ස්ටේඩියම් ගම යන ප්‍රදේශවල පදිංචි පවුල් 120කට ද කැලනිවැලි දුම්රිය මාර්ගයේ අද්දර පවුල් 500කට ද රත්මලාන ජලසම්පාදන මන්ඩලයේ නිවාසභූමියේ පවුල් 60කට ද ඉවත්ව යන ලෙස දැනුම් දී ඇත. මේ සියලු ජනයාට අලුතින් පදිංචිවීමට තැන් සපයා ඇත්තේ නැත.

මෙම දොට්ට දැමීමේ සැලසුම් සමග නාගරික දිලිඳු ජනයා "බලයෙන් පදිංචිවී සිටින්නන්" යයි හංවඩු ගසන දුෂ්ට ප්‍රචාරක ව්‍යාපාරයක් ද මුදාහැර ඇත. ගංවතුරට ද මදුරුවන්ගෙන් පැතිරෙන රෝගයන්ට ද හේතුව වන්නේ අනවසර පැල්පත් යයි නිරන්තරව කියනු ලැබේ.

සත්‍ය නම් මෙම පවුල් තමන්ගේ පැල්පත්වල අවුරුදු ගනනාවක් සමහරවිට පරම්පරා ගනනාවක් ජීවත්ව ඇති බවය. ඔවුන්ට පහත් ජීවන තත්වයන් තුල ජීවත් වීමට සිදුව ඇත්තේ බලයට පැමිනි කිසිදු ආන්ඩුවක් විසින්, සෞඛ්‍ය සහ අධ්‍යාපන සේවා ඇතුලු මූලික පොදු පහසුකම් සපයා නොතිබීම නිසා ය.

මේ අවුරුද්දේ පවත්වන ලද ජනාධිපති සහ පාර්ලිමේන්තු ඡන්ද විමසීම්වල දී ආන්ඩුව සහ විරුද්ධ පක්ෂය යන දෙගොල්ලම වඩා හොඳ නිවාස සහ දියුනු සේවාවන් මෙම පැල්පත් ප්‍රදේශවලට ලබා දීමට පොරොන්දු වූහ. මෙම තතු තුල මහජන කන්ඩායම් වශයෙන් පලවා හැරීමට ගෙන ඇති මෙම තීන්දුවට නිවැසියෝ බලවත් විරෝධය පලකලහ.

ඇපල්වත්ත ප්‍රදේශයේ එක් කාන්තාවක් ලෝක සමාජවාදී වෙබ් අඩවියට මෙසේ කීවාය: "මීට වඩා හොඳ තැනක මීට වඩා හොඳ නිවසක් අපට තිබුනා නම් මේ නරකාදියේ ජීවත් වෙන්ඩ අපට කිසිම උවමනාවක් ඇත්තෙ නෑ. අපේ ජීවනෝපායත් අපේ ලමයින් පාසල් යැවීමත් යන දෙකම මෙතන ජීවත්වීමත් එක්ක බැඳිල තියෙනව.

"ආන්ඩුව අපව පදිංචිකරන්න යන්නේ කොතැන දැයි අප දන්නේ නෑ. මේ ප්‍රදේශයම අප සඳහා දියුනු කර දීමට ඔවුන්ට බැරි ඇයි? අපට දොස් කියනවා වෙනුවට ආන්ඩුව කල යුත්තේ මේ ඇලවල් සුද්ධ කරල ශක්තිමත් කොංක්‍රීට් ඉවුරු හදල පිටාර ගැලීම වැලැක්වීමයි." කොම්පඤ්ඤවීදියෙන් එලවාදැමූ ඇගේ සමහර නෑයන්ට තාමත් නිවාස ලැබී නැති සැටි ඇය පෙන්නුම් කලාය.

දෙමටගොඩ නිවාස ව්‍යාපෘතියේ කාන්තාවක් 2008 දී තමන් සහ තවත් පවුල් ගනනාවක් කොම්පඤ්ඤවීදියෙන් එලවා දමනු ලැබූ බව කියා සිටියා ය. තමන්ට නිවාසයක් ලැබුනේ මේ අවුරුද්දේ ජනවාරියේ යැයි පැවසූ ඇය එයට ද නීත්‍යානුකූල අයිතියක් ලබා දී නැති බව කීවාය. එසේ වුව ද මුලින්ම රුපියල් 25,000ක් ද විදුලිය සම්බන්ධකම් සඳහා තවත් රුපියල් 6,600ක් ද ඔවුන්ට ගෙවීමට සිදුවූ අතර මසක කුලිය රුපියල් 1,000කි.

ඇය මෙසේ කීවාය: "මෙම ස්ථානයේ නිවාස 320ක් තියෙනවා. එක් නිවසක වපසරිය වර්ග අඩි 400ක් පමන වෙනව. සමහර විට එවන් එක් නිවසක පවුල් දෙකකට ජීවත් වෙන්න සිදුවෙලා තියෙනව. මෙම නිවාස ව්‍යාපෘතියේ පියවර 4ක් තියෙන බව කිව්වත් තවම සම්පූර්න කරල තියෙන්නේ පලමුවෙනි අදියර විතරයි. දොට්ට දැමූ ඉතිරි පවුල්වලට සිදුවන්නට යන්නේ කුමක් ද?"

විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂය පැල්පත් වැසියන්ගේ ආරක්ෂකයෙකු ලෙස රඟ පායි. දුම්රිය රක්ෂිතයන්ගෙන් පවුල් 3,100ක් ඉවත්කිරීමට විරුද්ධ උසාවි නඩු වලට තම පක්ෂයේ සහාය ලබා දෙන බව එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රවි කරුනානායක කියා සිටී. ඒත් එක්සත් ජාතික පක්ෂයට ආන්ඩුවේ වෙලඳපල හිතැති ආර්ථික වැඩපිලිවෙල සමග කිසිදු මූලික මතභේදයක් ඇත්තේ නැත. කලින් පැවති එක්සත් ජාතික පක්ෂ ආන්ඩු සියල්ලම කොලඹ නගරයේ පැල්පත් වැසියන් එලවා දැමීමේ තමන්ගේම වැඩ පිලිවෙලවල් ක්‍රියාත්මක කර ඇත.

නාගරික සංවර්ධන වැඩවලට හමුදාව යොදා ගැනීම වනාහී රාජපක්ෂ ආන්ඩුව තම පිලිවෙත් බලෙන් පැටවීමේදී කුමන විධික්‍රමයක් යොදාගන්නට යන්නේ ද යන්න පිලිබඳව සමස්ත කම්කරු පන්තියට කෙරෙන බරපතල අනතුරු ඇඟවීමකි. පසුගිය අවුරුද්දේ මැයි මාසයේදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය පරාජය කරදැමූ වාර්ගික යුද්ධය සඳහා කරන ලද දැවැන්ත වියදම්වල ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය බරපතල අර්බුදයකට ඇදවැටී තිබේ.

ඒ අතර 2008 දී පුපුරා ගිය ගෝලීය මූල්‍ය අර්බුදයෙන් ශ්‍රී ලංකාවේ ආන්ඩුවට බරපතල ලෙස බැට වැදී ඇත. රාජපක්ෂ ආන්ඩුවට පසුගිය අවුරුද්දේ දී ගෙවුම්ශේෂ අර්බුදයකින් ගැලවීගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩොලර් බිලියන 2.6ක නයක් ලබාගැනීමට සිදුවිය. දැන් ජාත්‍යන්තර මූල්‍ය

අරමුදල නියම කර ඇත්තේ අයවැය හිඟය 2012 වන විට දල ජාතික නිෂ්පාදනයෙන් සියයට 5 දක්වා එනම් දැන් පවත්නා මට්ටමෙන් හරි අඩක් කපා දමන ලෙස ය.

යුද්ධය තුලදී වර්ධනය කල පොලිස් රාජ්‍ය පියවරයන් මහජනතාවගේ වඩාත්ම පීඩිත හා දුබල කොටස්වලට එරෙහිව යොදා ගනු ලබමින් පවතී. රාජපක්ෂ ආන්ඩුවේ කප්පාදු පිලිවෙත්වලට එරෙහි කම්කරු පන්තියේ විරුද්ධත්වය සහ ප්‍රතිරෝධය උග්‍රවත්ම මෙම මෘග පියවරයන්ම කම්කරු පන්තියේ වඩාත් පලල් කොටස්වලට විරුද්ධව යොදවනු ඇත.

© www.wsws.org